**සජිත් ප්‍රේමදාස (පා.ම.)**
විපක්ෂ නායක - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

**சஜித் பிரேமதாச (பா.உ.)**
எதிர்க்கட்சித் தலைவர் - இலங்கை பாராளுமன்றம்

**Sajith Premadasa (M.P.)**
Leader of the Opposition - Parliament of Sri Lanka

2023-10-09

### මැතිවරණ කල් දැමීම හෝ මැතිවරණ නොපවත්වා සිටීම ප්‍රජාතන්ත්‍රවාදයට එල්ල කරන බරපතළ ප්‍රහාරයක්

මේ වන විටත් මැතිවරණ කල් දමා ඇති ආණ්ඩුව ලබන වසරේදී පැවැත්විමට නියමිත මැතිවරණත් කල් දැමීම සඳහා අවශ්‍ය කරන කූඨ උපක්‍රම සහ පිඹුරුපත් සකසමින් සිටින බව නොරහසකි.

ඊට ආණ්ඩුව සූදානම් වන්නේ “මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම” නැමැති අයිසින් තැවරූ කේක් කැබැල්ල දිගු කරමිනි. එය විෂ තැවරූ කේක් කැබැල්ලක් බවත් ඒවාට මේ රටේ ජනතාව නොරැවටෙන බවත් ආණ්ඩුවට අවධාරණය කළ යුතුය.

ජනතාවගේ පරමාධිපත්‍ය බලය සමග සෙල්ලම් කරන වර්තමාන ආණ්ඩුව එහි තීරණාත්මක ආරම්භය සනිටුහන් කලේ කළේ පැවැත්විය යුතුව තිබූ පළාත් පාලන මැතිවරණය අනීතික ලෙස කල් දමමිනි.

ජන වරමක් නැති පාලකයන්ට ජනතාවගේ ආශිර්වාදය කෙලෙසකවත් හිමි වන්නේ නැත. එහෙත්, අවස්ථාවාදී ලෙස බලය ඩැහැ ගත් පාලකයන් ජනවරම හෝ ජනතා කැමැත්ත පිළිබඳව මායිම් නොකොට විවිධ දේශපාලන උපාය උපක්‍රම භාවිතා කරමින් සිය පාලන කටයුතු කරගෙන යෑමට දරන උත්සාහයේ අවසානය ඛේදවාචකයක් බව මුළු ලෝකයෙන්ම අත්දැකිය හැකි සත්‍යයි.

එමෙන්ම මෙරට ද මැතිවරණ කල් දැමීමෙන් සිදුව ඇති ඛේදවාචකයන් පිළිබඳව ඕනෑතරම් උදාහරණ ලබාගත හැකි අතර වර්තමාන ආණ්ඩුව සූදානම් වන්නේ නැවතත් අන්ධකාර අතීතයකට මේ රට රැගෙන යාමට දැයි අපි ප්‍රශ්න කර සිටිමු.

ව්‍යවස්ථාවට අනුව පැවැත්විය යුතු මැතිවරණ කල් දැමීම හෝ මැතිවරණ නොපවත්වා සිටීම රටක ප්‍රජාතන්ත්‍රවාදය ඉලක්ක කර ගනිමින් එල්ල කරන බරපතළ ප්‍රහාරයක් බව නොරහසකි.

“මැතිවරණය කල් දමන්නේ නෑ, කල් දමන්න මැතිවරණයක් නැහැ” යනුවෙන් ජනතා පරමාධිපත්‍ය පාර්ලිමේන්තුව තුළම උපහාසයෙන්, අපහාසයෙන් සහ නින්දා සහගත ලෙස සුනු විසුනු කළ ජනාධිපතිවරයෙක් සිටින ආණ්ඩුවකින් මැතිවරණයක් බලාපොරොත්තු වීම සිහිනයක් පමණක් වන නමුත්, ඒ දුර්දාන්ත ක්‍රියාවලියට එරෙහිව ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගැනීමට අප සූදානම් බවද ආණ්ඩුවට අවධාරණය කරනු කැමැත්තෙමු.

ප්‍රජාතන්ත්‍රවාදය සහ ජනතා පරමාධිපත්‍යය පරමාධිපත්‍යය මර්දනය කිරීමට ඒකාධිපති ප්‍රජාතන්ත්‍ර විරෝධී ආණ්ඩුව විසින් ගනු ලබන සිය ක්‍රියාමාර්ග ජනතා බලය මගින් ඒකාන්ත ම පරාජය කරන බවද අපි ආණ්ඩුවට අවධාරණය කරමු.

සජිත් ප්‍රේමදාස
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක

දුරකතන : / தொலைபேசி : / Telephone : 011 2 777 253 / 011 2 699 171
ෆැක්ස් : / தொலைநகல் : / Fax : 011 2 699 174
විද්‍යුත් තැපෑල : / மின்னஞ்சல் : / Email : sajith_p@dialogsl.net

අංක 30, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 7
இலக்கம் 30, சர் மார்கஸ் பெர்னாண்டோ மாவத்தை கொழும்பு 7
No 30, Sir Marcus Fernando Mawatha Colombo 7